ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ පළමුකාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2025

(දෙවනවර /තෙවනවර විෂයයන් දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් අයදුම්කරන අයදුම්කරුවන් සඳහා)

## මාර්ගගතව අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

විශේෂ සටහන

මෙම විභාගය සඳහා පහත පරිදි අයදුම්පත් කැඳවනු ලබන අතර, ඒ සඳහා දී ඇති දිගුවන් (Link) දෙකෙන් ඔබ තෝරා ගෙන ඇත්තේ නියමිත දිගුව ද යන්න දත්ත ඇතුළත් කිරීමට පෙර තහවුරු කර ගන්න.

| | |
|---|---|
| දිගුව 1 | පළමුවරට අයදුම්කරන අයදුම්කරුවන් හා දෙවනවර හෝ තෙවනවර එක විෂයයක් පමණක් අයදුම්කරන අයදුම්කරුවන් සඳහා |
| දිගුව 2 | දෙවනවර හෝ තෙවනවර විෂයයන් දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් අයදුම්කරන අයදුම්කරුවන් සඳහා |

A. මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි කැපිටල් අකුරින් පමණක් පිරවිය යුතුය.

B. මාර්ගගත අයදුම්පතේ සඳහන් "Medium,", "Personal Information,", "Declaration of the candidate" යන කොටස් මාර්ගගත ආකාරයෙන් (online) සම්පූර්ණ කළ යුතුය.

C. සම්පූර්ණ කරන ලද තොරතුරු නිවැරදිව හා දී ඇති උපදෙස් පරිදි සම්පූර්ණ කර තිබේදැයි පරීක්ෂා කර තහවුරු කරගන්න. (පොදු උපදෙස් හා තාක්ෂණික උපදෙස් පරිදි)

D. ඉන් පසු "Submit this application" හා "Proceed to payment" click කර, මුදල් ගෙවා "Complete and Submit" click කර අයදුම්පත මාර්ගගතව යොමු කළ යුතුය.

E. අයදුම්පතේ මෘදුපිටපත බාගත කර (download), මුද්‍රිත පිටපතක් (printout) ලබාගත යුතුය. අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් සහතික කරගත යුතු වේ. එසේ සහතික නොකළ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

F. මෙසේ සම්පූර්ණ කරන ලද මුද්‍රිත පිටපත ලියාපදිංචි තැපැලෙන් "විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ.1503, කොළඹ" ලිපිනයට එවිය යුතුය. පසුව කරනු ලබන විමසීම් සඳහා එහි පිටපතක් ළඟ තබාගත යුතුය.

G. එක් අයදුම්කරුවකු හට එවිය හැකි වන්නේ එක් අයදුම්පතක් පමණි.

H. අයදුම්කරුවන්හට මුදල් ගෙවීමේ ක්‍රමවේද (Payment Method) වෙනස් කළ හැක්කේ එක් වරක් පමණි.

I. දී ඇති උපදෙස්වලට පටහැනිව මාර්ගගතව යොමු කරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

J. අයදුම්කරු විසින් මාර්ගගත අයදුම්පතේ ඇතුළත් කරනු ලබන ජංගම දුරකථන අංකය වෙත විභාගය සම්බන්ධව සිදුකරනු ලබන සියලුම දැනුම්දීම් SMS මඟින් එවනු ලැබේ.

K. මාර්ගගත පද්ධතියට ප්‍රවේශවීම (Login) සඳහා ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය පමණක් ඇතුළත් කරන්න. අන් අයගේ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීමෙන් වළකින්න.

2. අයදුම්පත පිරවීමේදී විශේෂිත අක්ෂර (Special Characters) වන “ ” ?: { }[ ]’!`~#$%^* <> = + - _ | නොයෙදිය යුතුය. එවැනි විශේෂිත අක්ෂර යොදා සම්පූර්ණ කර ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
3. විභාග ගාස්තු ගෙවීමේදී පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.
   i. බැංකු ණය කාඩ්පතක් මඟින් (Bank Credit Card)
   ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සක්‍රීය කර ඇති බැංකු හර කාඩ්පතක් මගින් (Bank Debit Card with internet payment facility)
   iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකින් ක්‍රමය (Bank of Ceylon Online Banking Method)
   iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Bank of Ceylon branch)

   ඉහත ක්‍රම මඟින් ගෙවීම් කරනු ලබන ආකාරය සඳහා **(ආ) තාක්ෂණික උපදෙස්** බලන්න.
4. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලබන අතර, විභාග ගාස්තු ආපසු ගෙවීම (Refund exam payment) හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම හෝ කරනු නොලැබේ.
5. අයදුම්කරු විසින් නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පතේ දත්ත, මාර්ගගත පද්ධතියට ඇතුළත් කිරීමට පෙර, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවන ලද නීතිරීතිවලට එකඟවන බව තහවුරු කළ යුතුය.
6. අදාළ විභාගයට මුදල් ගෙවා අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු (“**Complete and Submit**”), එය බාගත කර (download), මුද්‍රිත පිටපතක් (printout) ලබාගෙන අත්සන සහතික කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුය.
7. මාර්ගගත අයදුම්පත් සම්බන්ධයෙන් පහත සඳහන් විධිවිධාන බලපැවැත්වේ.
   - අසම්පූර්ණ හා සාවද්‍ය තොරතුරු සහිත මාර්ගගත අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
   - මුදල් නොගෙවන ලද අයදුම්පත් (පළමුවන වරට අයදුම්කරන නිලධාරීන් හැර) ප්‍රතික්ෂේප කරනු ලැබේ.

     අයදුම්පතේ මුද්‍රිත පිටපතේ අදාළ අත්සන් යොදා ලියාපදිංචි තැපැල මඟින් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර, විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ යන ලිපිනය වෙත එවිය යුතු වේ. කවරයේ වම්පස ඉහළ තමා අයදුම්කරන විභාගයේ නම නිවැරදිව සටහන් කළ යුතුය. එසේ මුද්‍රිත පිටපත සම්පූර්ණ කර නොඑවුවහොත් මාර්ගගත අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ.
   - අයදුම්පත නැතිවීම හෝ ප්‍රමාද වීම සම්බන්ධව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් වගකියනු නොලැබේ.

8. විමසීම් කිරීම - **කාර්යාලීය වේලාවන් තුළදී පමණි.**

   - බඳවා ගැනීම් සහ සුදුසුකම් පිළිබඳව - අධ්‍යාපන අමාත්‍යාංශය - 0112785141
   - විභාග අයදුම්පත් යොමු කිරීම පිළිබඳව - 011-2785230, 0113661244
   - ලංකා බැංකු ශාඛා මගින් ගෙවීම් පිළිබඳව - 011 2205280

   .

9. අයදුම්පත් මාර්ගගතව යොමු කළ පසු එහි සඳහන් වන තොරතුරු කිසිදු හේතුවක් මත පසුව වෙනස් කරනු නොලැබේ. එබැවින් අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ පූර්ණ වගකීම වේ.
10. අයදුම්පතේ මුද්‍රිත පිටපතේ සිදුකරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ.
11. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට මෘදු පිටපතේ (Soft copy) සඳහන් තොරතුරු නිවැරැදි තොරතුරු බවට සලකා ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.


**<u>(ආ) තාක්ෂණික උපදෙස්:</u>**

1. **පද්ධතියට ප්‍රවේශ වීම**

   i. අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියට ප්‍රවේශ වන්න ([www.doenets.lk](http://www.doenets.lk)).


   ii. එහි අපගේ සේවා (Our Services) යටතේ ඇති "**Online Applications (EB Exams)** " මුහුණත (Tile) මත Click කරන්න.

   iii. ඉන්පසු ඔබට පහත දිස්වන වෙබ් පිටුවට ප්‍රවේශ විය හැක.




   iv. එහි ඇති "**Apply for Exams**" මඟින් අදාළ විභාගය වෙත ප්‍රවේශ විය හැක.


2. “**Apply for Exams**”




i. අයදුම් කළ හැකි විභාග සම්බන්ධ තොරතුරු ඉහත කවුළුවෙන් දිස්වේ.

ii. එහිදී විභාගය සම්බන්ධ ගැසට් නිවේදනය බාගත කළ හැක.

➢ **Apply** - පළමුව ඔබට ප්‍රවේශ වීමේ කවුළුවක් (Login Window) දර්ශනය වන අතර **එහි ඔබේ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීම අනිවාර්ය වේ.** එයට අමතරව තම ජංගම දුරකථන අංකය හෝ ඊ-මේල් ලිපිනය හෝ ඒ දෙකම හෝ ඇතුළත් කර “**I Agree with the Terms and Conditions**” “√” කර **reCAPTCHA** “√” කර “**Next**” Click කරන්න.




➢ ඔබට පහත කවුළුව (Verify OTP Window) දිස්වේ. ඔබගේ ජංගම දුරකථන අංකයට (SMS මගින්) හෝ ඊ-මේල් ලිපිනයට ලැබී ඇති **OTP verification code** ඇතුළත් කර “**Submit**” click කරන්න.

Verify OTP

NIC : 200052124521

Mobile : 0715524123

Email : meleesap@gmail.com

Enter the OTP code sent to you via SMS/ Email *

Haven't received the code yet? Resend OTP

Change Mobile/ Email

Cancel Submit

## 3. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීම

පහත අයිතමයන් සම්පූර්ණ කිරීමේදී දක්වා ඇති උපදෙස් පිළිපදින්න.

i. සම්පූර්ණ කළ යුතු මාර්ගගත අයදුම්පතේ ඇති අයිතමයන්හි * සලකුණ යොදා ඇති සෑම අයිතමයක්ම ඔබ විසින් අනිවාර්යයෙන් පිරවිය යුතු වේ.

විභාගයට පෙනී සිටින මාධ්‍යය, සඳහන් කරන්න.

### Medium

* The Medium of Language through which the Officer sits the Examination

Sinhala

ii. පෞද්ගලික තොරතුරු අදාළ පරිදි ඇතුළත් කරන්න.

### Personal Information

* Name in Full (IN BLOCK CAPITAL LETTERS)

HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA

Ex: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA Max Length : 90

* Name indicating the last name first and the initials at the end (IN BLOCK CAPITAL LETTERS)

GUNAWARDHANA, H.M.S.K.

Ex: Gunawardhana, H.M.S.K. Max Length : 90

* National College of Education/ Teachers' College/ Teachers' Centre wherein the candidate is serving and its Address (IN BLOCK CAPITAL LETTERS) The admis...

National Institute of Education, High Level Road, Maharagama

Must use Commas (,) as shown in the example: National Institute of Education, High Level Road, Maharagama. Max Length : 120

* Personal Address (IN BLOCK CAPITAL LETTERS)

254/2, PELAWATTA, BATTARAMULLA.

Must use Commas (,) as shown in the example: 254/2, PELAWATTA, BATTARAMULLA. Max Length : 120

* Mobile Phone Number

0712568748

Max Length : 10

* Land Line Number

0112457895

Max Length : 10

* Gender

Male

* Date of birth

3/10/1992

* Designation

Sri Lanka Teacher Service GIII

Max Length : 50

If yes, please state the nature of such special needs

-

Max Length : 150

The subjects for which the candidate sits should be clearly indicated with the Subject Number and the Subject mentioned under (a) in para two of the notification.

* Subject/s for which you appear

- [x] 01 - General Management and Establishments Affairs
- [ ] 02 - Financial Regulations
- [ ] 03 - Education Reforms and Education Law
- [x] 04 - Communication Skills

* Whether sat the full or part of the Examination before and if so, mention the subjects and the year of sitting the Examination and the mediums.

| | Subject | Year | Medium | Index Number |
|---|---|---|---|---|
| ⊖ | Education Reforms an | 2023 | Sinhala | 4012547 |
| ⊖ | Financial Regulations | 2023 | Sinhala | 4012547 |

⊕

* Are you a candidate with special needs ?

No

If yes, please state the nature of such special needs

\-

Max Length : 150

## Declaration of the Candidate

I do hereby declare that the information mentioned above is accurate and I am entitled to sit this Examination in the medium of Language mentioned as per para 04 of this Gazette notification. I have paid the relevant examination fee / I am exempted from paying the examination fee. Further, I do declare that I agree to be liable to the rules and regulations imposed by the Commissioner General of Examinations pertaining to the conduct of the Examination and the issuance of results.

* Signature of the Applicant (Please type your name)

GUNAWARDHANA, H.M.S.K.

Max Length : 50

* Date

1/15/2025

- මුද්‍රිත පිටපත ලබා ගැනීමෙන් පසු අනු අංක (4) හි අත්සන හා දිනය සහ අනු අංක (5) තොරතුරු අත් අකුරින් පිරවිය යුතුය.
  (Please print the application form and fill the following details by hand.)

  (4) Attestation of Signature

  (අයදුම්කරුගේ අත්සන සහතික කිරීම)

  මුද්‍රිත පිටපතෙහි අදාළ ස්ථානයේ අයදුම්කරුගේ අත්සන සහතික විය යුතුයි.


  (5) Certification of the Head of the Department

  දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

  මුද්‍රිත පිටපතෙහි අදාළ ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තම අත්සන යෙදිය යුතුයි.

**(4)** සම්පූර්ණ කරන ලද අයදුම්පත සංශෝධන සිදුකිරීම

අයදුම්කරු අයදුම්පත සම්පූර්ණ කිරීමෙන් පසු ඔබට වම්පස පහත රූපයේ දිස්වන පරිදි button දෙකක් දක්නට ලැබේ.



- “**Save**” - මෙය click කිරීමෙන් ඔබට අයදුම්පත් භාරගන්නා අවසාන දිනය හා වේලාව තෙක් ඔබගේ තොරතුරු පිරවිය හැකි වේ. එනම් නැවත මාර්ගගත පද්ධතියට පිවිස තම තොරතුරු ඇතුළත් කිරීම/සංශෝධනය කිරීම සිදු කළ හැකිය.
- එසේම අයදුම්පත **මාර්ගගතව යොමුකර අවසන් වී ඇතිනම්** නැවත මාර්ගගත පද්ධතියට පිවිසීම සඳහා පද්ධතියට ප්‍රවේශ වන (**Our Services**) යටතේ ඇති “**Online Applications (Recruitment Exams)**”මුහුණත (Tile) මත Click කරන්න.

  නමුත්, ඔබ විසින් “**Submit this application**” click නොකර ඉදිරි ක්‍රියාවලිය සිදු නොකරන්නේ නම්, අයදුම්පත් භාරගන්නා අවසාන දිනය හා වේලාවෙන් පසුව ඔබගේ අයදුම්පත ප්‍රතික්ෂේප වේ.
- **“Submit this application” -** අයදුම්පතේ සියලු තොරතුරු ඇතුළත් කළ පසු ඉදිරියට යාමට “Submit this application” click කළ යුතුය.
- “**Submit this application**” click කළ පසු ඔබ විසින් ඇතුළත් කරන ලද තොරතුරු පහත රූපයේ පරිදි දිස්වේ (preview).

Personal Information

| | |
|---|---|
| Select the relevant title | -- |
| Name in Full (IN BLOCK CAPITAL LETTERS) | HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA |
| Postal Address (IN BLOCK CAPITAL LETTERS) | 254/2, PELAWATTA, BATTARAMULLA. |
| Contact Number (Mobile)(For the future communication through SMS) | 0712874125 |
| Contact Number (Residence) | 0112478452 |
| Email Address | test@gmail.com |
| Gender | Male |
| Date of Birth | 02 Jun 1992 |
| Are you a citizen of Sri Lanka? | Yes |

Educational Qualifications (English Language)

| | |
|---|---|
| Do you possess a Credit pass in English Language at the G.C.E. (O/L) or N.C.G.E. or S.S.C. or international GCSE Examination? | Yes |
| Grade obtained | C |
| Name of the examination | G.C.E.(O/L) Examination |
| Name of the Dept./ Institution | Department of Examinations |
| Year | 2003 |


- යම් හෙයකින් ඔබගේ තොරතුරු නැවත සංශෝධනය (Edit) කළ යුතු නම්, නැවත අයදුම්පත වෙත ගොස් (←———) , සංශෝධනය (Edit) කර, “Submit this application” click කිරීමෙන් ඉදිරියට යා හැකිය.

- ඇතුළත් කරන ලද තොරතුරු නිවැරදි නම් පහත රූපයේ පරිදි එකඟතාව පළකිරීමෙන් ඉදිරියට යා හැකිය.

## (5) විභාග ගාස්තු ගෙවීම


**සැ.යු. අයදුම්කරුවන් හට විභාග ගාස්තු ගෙවීමේ ක්‍රමවේදය (Payment Method) වෙනස් කිරීමට හැකියාව ලබාදී ඇත්තේ එක්වරක් පමණි.**

පහත රූපයේ පෙන්වා ඇති පරිදි ඔබ විසින් විභාග ගාස්තු ගෙවීමට බලාපොරොත්තු වන ක්‍රමවේදය තෝරන්න.




➢ **Pay with Credit/Debit Card** ක්‍රමවේදය

- මේ සඳහා සේවා ගාස්තු වශයෙන් විභාග ගාස්තුවෙන් 1.7% ක මුදලක් අයකරනු ලබයි.
- ඉහත ක්‍රමවේදයෙන් ගෙවීම් කිරීම සඳහා ඔබගේ **Credit/Debit කාඩ්පත** අන්තර්ජාල ගෙවීම් පහසුකම සක්‍රීය කර ඇති බැංකු **Credit/Debit** කාඩ්පතක් විය යුතුය.
- එසේ නොවන බැංකු **Credit/Debit**කාඩ්පත් මගින් ගෙවීම් කළ නොහැකිවන අතර ඔබගේ ගෙවීම ප්‍රතික්ෂේප වේ.





➢ **Pay with BOC ක්‍රමවේදය**


“**Pay with BOC**” මගින් මුදල් ගෙවීමේදී පහත පරිදි ඔබට යොමු අංකයක් (Reference Number) ලැබේ. එය රැගෙන ඕනෑම ලංකා බැංකු ශාඛාවක් වෙත ගොස් හෝ ලංකා බැංකු ඔන්ලයින් බැංකින් ක්‍රමවේදයෙන් හෝ මුදල් ගෙවීම් සිදුකර නැවත මාර්ගගත පද්ධතියට පිවිසිය යුතුය. විභාග දෙපාර්තමේන්තු ගිණුම් අංකයට සෘජුවම Slip මගින් ගෙවීම් නොකළ යුතුය.

නැවත මාර්ගගත පද්ධතියට පිවිසීම සඳහා පද්ධතියට ප්‍රවේශ වන (**Our Services**) යටතේ ඇති “**Online Applications (Recruitment Exams)**” මුහුණත (Tile) මත Click කර හෝ https://applications.doenets.lk වෙත පිවිස එහි “**Continue after payment**” Click කරන්න. ඉන්පසු ඔබේ යොමු අංකය (Reference Number) ඇතුළත් කර ඉදිරියට යන්න.


**සැ.යු: “Pay with BOC” මගින් ගෙවීම් කිරීමේදී ලංකා බැංකුව විසින් සේවා ගාස්තු වශයෙන් එක් අයදුම්පතක් සඳහා රු. 20.00 ක මුදලක් අයකරනු ලබයි.**



- මුදල් ගෙවූ පසු නැවත මාර්ගගත පද්ධතියට පිවිස එහි ඇති “**Continue after Payment**” click කරන්න.




- ඉන්පසු පහත රූපයේ පරිදි ඔබගේ යොමු අංකය (**Reference Number**) පද්ධතියට ඇතුළත් කර ඉදිරියට යන්න.





- ඉහත ක්‍රම මඟින් මුදල් ගෙවූ පසු, මුදල් ගෙවූ බවට අදාළ ලදුපත ප්‍රදර්ශනය වන අතර, එය මුද්‍රණය කර ගත හැක. එසේම මෙම තොරතුර ඔබගේ ජංගම දුරකථන අංකයට (SMS මඟින්) හෝ ඊමේල් ලිපිනයට ද යැවේ.




**(6) අයදුම්පත මාර්ගගතව යොමු කිරීම**

මුදල් ගෙවූ පසු අයදුම්පත මාර්ගගතව යොමු කිරීම සඳහා පහත රූපයේ පරිදි විභාග දෙපාර්තමේන්තු කොන්දේසිවලට (**Terms and Conditions**) එකඟවන බවට හා අයදුම්පත


යොමු කිරීම තහවුරු කිරීම (**Confirm**) සිදුකළ යුතුය. ඉන්පසු "**Complete & Submit**" click කරන්න.




**(7) අයදුම්පත බාගත කිරීම (Download) හා මුද්‍රිත පිටපත (Printout) ලබා ගැනීම**

පහත රූපයේ පරිදි "**Download my application**" click කිරීමෙන් ඔබගේ අයදුම්පත බාගත කර ගත හැක. බාගත කරගත් පසු එහි මුද්‍රිත පිටපතක් ලබාගන්න. එම මුද්‍රිත පිටපතෙහි මාර්ගගතව පුරවන ලද තොරතුරුහි කිසිදු සංශෝධනයක් (Edit) සිදු නොකළ යුතුය.

අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතේ අයදුම්කරුගේ අත්සන සහතික කර ආයතන ප්‍රධානිගේ සහතිකය සමග " විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙලවරේ තමා අයදුම්කරන විභාගයේ නම නිවැරදිව සඳහන් කළ යුතුය.



**(8) මාර්ගගත අයදුම්පත ලද බව දැන්වීම**

අයදුම්පත් භාර ගැනීම අවසන් වූ පසු අයදුම්පත දෙපාර්තමේන්තු පද්ධතිය මගින් තහවුරු කළ පසු අයදුම්පත ලද බව SMS මගින් අයදුම්කරුට දැනුම් දෙනු ලැබේ.